---

**මාතර මහා නගර සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 22 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 14 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 19 දින මහා නගර සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාතර මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුල රු.212,051,507 ක් වූ ආදායම්ද, රු.204,723,288 ක් වූ වියදම්ද ඇතුළත් වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නගර සභාවේ පුස්තකාල 02 ක් වෙනුවෙන් පොත් පරිත්‍යාග ලැබීම් වටිනාකම රු.3,446,453 ක් වුවද ජර්නල් සටහන් අංක 16 මගින් ප්‍රාග්ධනීත කර තිබුණේ රු.480,195 ක් පමණක් වූයෙන් රු.2,966,258 ක් වටිනා පොත් වල වටිනාකම අඩුවෙන් ප්‍රාග්ධනීත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන මෝටර් රථ හා කරත්ත පිළිබඳ උපලේඛණයේ මෝටර් රථ හා කරත්තවල තථ්‍ය අගය තක්සේරු කර ගිණුම් ගත නොකොට දළ වටිනාකම වූ රු.41,725,000 ක් පමණක් ගිණුමේ දක්වා තිබුණි.

(ඈ) බස් නැවතුම් පොළ හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් වූ ණය ගිවිසුමේ 9.03 කොන්දේසිය හා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2001 අගෝස්තු 20 හා අංක 7/3/12 ලිපිය පරිදි ණය ආපසු ගෙවීම වෙනුවෙන් රුහුණ සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණු ස්ථාවර තැන්පත් පොළී ආදායම සභා ආදායමක් නොවුවද, එකී තැන්පතුව වෙනුවෙන් ලැබී තිබූ රු.5,253,127 ක

පොළ ආදායම් ජර්නල් සටහන් අංක 44 මගින් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලැබීම් ලෙසට ගිණුම් ගත කර තිබුණි.

(ඉ) ගබඩා ලැබීම් පත්‍රිකා වලට අනුව සමාලෝචිත වර්ෂයේ මිළදී ගැනීම් වටිනාකම රු.14,599,530 ක් වුවද, ප්‍රධාන ලෙජරයෙහි ගබඩා අත්තිකාරම් ගිණුමට අනුව එකී වටිනාකම රු.23,907,486 ක් වූයෙන් රු.9,307,956 ක වෙනසක් විය.

1.3.2 නිරවුල් නොකල ගිණුම්

රු.27,714,750 ක් වූ නිරවුල් නොකල ගිණුම් ශේෂයන් 13 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 කට අදාලව වටිනාකම රු.21,631,942 ක් වූ අතර ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව වටිනාකම රු.22,844,946 ක් වූයෙන් වෙනස රු.1,213,004 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) තොරතුරු ඉදිරිපත් නොකිරිම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.225,511,938 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂය අවසානය වන විට විගණන විමසුම් 22 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.63,647,092 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,328,218 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,066,243 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 37,203 | 13,734 | 35,341 |
| (ii) | බදු කුලී | 17,036 | 6,662 | 13,713 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 9,950 | 3,669 | 1,035 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.1,018,449 ක මුදලක්ද, මුදදර ගාස්තු වශයෙන් රු.4,881,365 ක මුදලක්ද ලැබිය යුතුව තිබුණි.

2.2.3 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල හිඟහිටි මුදල වර්ධනය වී තිබූ අතර 2011 වර්ෂයේ රුපියල් මිලියන 30.8 ක් වූ හිඟය ප්‍රවර්තන වර්ෂයේ රුපියල් මිලියන 35.3 ක් වූයෙන් හිඟය වැඩිවීමේ ප්‍රතිශතය සියයට 14.6 ක් විය.

(ආ) එක් එක් වර්ෂයේ බිල්කල මුදලින් අයවූ මුදල ගණනය කළහැකි ආකාරය දැක්වෙන පරිගනක පැකේජයක් නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.50,000 වැඩියෙන් හිඟහිට පවතින රාජ්‍ය ආයතන 11 කින්, වාණිජ පාරිභෝගික ස්ථාන 9 කින්, ගෘහ පාරිභෝගික 23 කින්, එකතුව රු.6,693,046 ක මුදලක් හිඟහිට පැවතිණි.

(ඈ) මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) ජේදය පරිදි නාගරික කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟහිටි මුදල හා බිල්කල මුදලේ එකතුව වූ රු.47,321,931 ක මුදල අයකර ගැනීම සඳහා බදු එකතු කරන්නන් 14 දෙනෙකු වෙත කාර්තු වශයෙන් පවරා තිබූ අතර එකී බදු එකතු කරන්නන් කාර්තු තුනකදී අයකරදී තිබුනේ රු.4,217,129 ක් පමණි. මෙම බදු එකතු කරන්නන් දෙදෙනෙකු හැර ඉතිරි 12 දෙනාගේ බදු අයකර දීමේ ප්‍රතිශතය සියයට 15 ක් තරම් සුළු අගයක් විය.

(ඉ) 2008 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුල ඉදිරියට ගෙන එමින් පවතින රු.35,341,291 ක හිඟ බදු අයකර ගැනිම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252(1)(අ) උප වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.2.4 කඩකාමර කුලී

සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාවට අයත් වෙළඳ ස්ථාන 08 ක කඩ කාමර 378 කින් රු.19,702,109 ක හිඟහිටි මුදලක්ද කඩ කාමර 99 කින් එක් වන් මුදල් රු.19,909,620 ක්ද වශයෙන් රු.39,611,729 ක මුදලක් හිඟහිට තිබුණි.

## 2.3 බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණය ඉදිකිරිම.

යථෝක්ත ඉදිකිරිම සඳහා 1995 ජනවාරි 03 දින නාගරික සංවර්ධන අධිකාරියෙන් රු. 49,774,022 ක ණය මුදලක් ලබාගෙන වෙළඳ සංකීර්ණයේ කඩකාමර 120 ක් ඉදිකරන ලදි. ණය ගිවිසුම අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් ණය මුදල ගෙවා නිමකළ යුතු අතර ගෙවිය යුතුව තිබූ මුළු ණය හා පොලී මුදල රු.126,480,000 ක් විය. 2012 දෙසැම්බර් 31 දින දක්වා ගිවිසුම්ගත පරිදි කිසිදු ණය වාරික මුදලක් ගෙවා නොතිබූ අතර පොලි වශයෙන් රු. 9,556,612 ක් ගෙවා තිබුණි. කඩ බදුකරුවන්ගෙන් අයකරගෙන ඇති එක්වත් මුදල් හා මාසික කඩ බදු මුදල් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් මා වෙත ඉදිරිපත් කරන ලෙස 2010 ඔක්තෝබර් 06 දින මා විසින් නගරාධිපතිවරයාගෙන් ඉල්ලා තිබුණ ද 2013 මැයි 22 දින තෙක් පිළිතුරක් නොලැබුණි.

## 2.4 පදික වෙළඳ සැල් සංකීර්ණ ඉදිකිරිම

සභාව සතුව තිබූ ස්ථාවර තැන්පතු ඇපයට තබා 2007 අප්‍රේල් 20 දින මාතර රුහුණු සංවර්ධන බැංකුවෙන් රු.9,500,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ණය ගිවිසුම අනුව කිසිදු ණය වාරික මුදලක් 2013 මැයි 31 දින දක්වා ගෙවා නොතිබූ අතර පොලී වශයෙන් රු.5,012,242 ක් ගෙවා තිබුණි. ගිවිසුම්ගත පරිදි ණය වාරික ගෙවා නොතිබුනෙන් සභාව සතුව තිබූ ස්ථාවර තැන්පත් බැංකුව පවරා ගෙන තිබුණි. පවරාගනු ලැබූ අවස්ථාවේදි ස්ථාවර තැන්පතු වල නාමික අගය (පොලී ඇතුළුව) රු.15,971,619 ක් විය. ගිවිසුම්ගත පරිදි ණය වාරික හා පොලි ගෙවනු ලැබුවේ නම් 2013 මැයි 31 දිනට ගෙවිය යුතුව තිබූ මුළු ණය හා පොලී රු.12,757,462 ක් ගැලපීමෙන් පසු තවදුරටත් ගෙවිය යුතුව තිබූ මුදල රු.7,745,220 ක් විය. බැංකුව විසින් 2013 මැයි 31 දින ස්ථාවර තැන්පතු පවරාගනු ලැබූ අවස්ථාවේදි ඒවායේ නාමික අගය (පොලී ඇතුළුව ) රු.15,971619 ක් වූයෙන් ණය වාරික මුදල් හා පොලී මුදල් කාලීනව නොගෙවීම නිසා සභාවට සිදු වී ඇති මූල්‍ය පාඩුව රු. 8,226,399 ක් විය.

2.5 නගරාධිපතිවරයාට මෝටර් රථයක් මිලදී ගැනීම.

---

නගරාධිපතිවරයාට මෝටර් රථයක් මිලදී ගැනීම සඳහා රුහුණු සංවර්ධන බැංකුවේ රු.5,600,000 ස්ථාවර තැන්පතු ඇපයට තබා 2007 වර්ෂයේ රු. 5,625,000 ක මුදලකට මෝටර් රථයක් මිලදී ගෙන තිබුණි. 2013 මැයි 31 දිනට ගෙවිය යුතුව තිබූ ණය වාරික හා පොලී මුදල රු. 7,550,208 ක් වූ අතර එදිනට කිසිදු ණය වාරික මුදලක් ගෙවා නොතිබුණි. එදිනට පොලී වශයෙන් රු.3,324,260 ක් ගෙවා තිබුණි. ගිවිසුම්ගත පරිදි ණය වාරික හා පොලී මුදල් කාලීනව ගෙවන ලද්දේ නම් ගෙවිය යුතුව තිබූ ඉතිරි මුදල රු.4,225,748 ක් විය. ණය වාරික මුදල් ගෙවා නොතිබූ බැවින් ස්ථාවර තැන්පතු වටිනාකම 2013 මැයි 31 බැංකුවට පවරාගෙන තිබූ අතර එම අවස්ථාවේදී ස්ථාවර තැන්පතු වල නාමික අගය රු. 8,969,917 ක් විය. ණය මුදල් කාලීනව නොගෙවීමේ හේතුවෙන් සභාවට රු. 4,744,169 ක මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි.

2.6 මාතර බස් නැවතුම් පොළේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීම

---

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ කඩිනම් සංවර්ධන වැඩ සටහන යටතේ රු.3,675,376 ක ප්‍රතිපාදන 2012 පෙබරවාරි 28 දින සභාව වෙත ලැබී තිබුණි. පල්දෝරු පද්ධතිය ඉදිකිරීම් සඳහා පුද්ගලික ආයතනයක් සමඟ රු.3,675,376 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර 2012 අගෝස්තු මස 10 දින රු.2,061,097 ක මුදලක් අදාල කොන්ත්‍රාත්කාර ආයතනය වෙත ගෙවා තිබුණි.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් පල්දෝරු පද්ධතිය සඳහා ඉදිරිපත් කර තිබ සැලැස්මේ සඳහන් ඉදිකිරීම් අනුව (Septic tank and uplow filters ) බස්නැවතුම්පල වැසිකිළිවල අපද්‍රව්‍ය සෘජුව ගලා ඒමක් නොවූ අතර සභාව ඉදිකර තිබූ ටැංකිය හරහා එම වලට එකතුවීම සලසා ඇති බව 2013 ජුනි 28 දින භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) දිග මීටර් 7 සහ පළල මීටර් 4.4 ක් වූ නව ටැංකියේ අපද්‍රව්‍ය මිශ්‍ර ජලය නල මාර්ගයක් දිගේ ප්‍රධාන කානුවට සම්බන්ධ කර තිබූ බව නිරීක්ෂණය වූ අතර එමගින් දුර්ගන්ධයක් වහනය වූ බැවින් එහි වූ ජලය පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් 2012 ඔක්තෝබර් 30 දිනැතිව ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංසථාව වෙතත් ඉල්ලමක් කර තිබුණද එම වාර්තාව 2013 ජුනි මස 28 දින වන විටද ලැබී නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ 1986 මාර්තු 10 දිනැති අංක 392/6 දරණ ගැසට් පත්‍රයේ 62 වන වගන්තියේ විධිවිධාන වලට පටහැනිව වැසිකිළි අපද්‍රව්‍ය මාතර නගරයේ ප්‍රධාන කානුවකට සම්බන්ධ කර තිබූ අතර එම කණුවද කැඩිබිදී ගොස් තිබූ බව නිරීක්ෂණය විය. තවද බස් නැවතුම්පල කඩ කිහිපයක බිත්ති අනවසරයෙන් කඩා ඉවත් කර ඒවායේ අපද්‍රව්‍ය ප්‍රධාන කාණුවට ගලා යාමට සැලැස්වීම නිසා දැඩි අප්‍රසන්න තත්ත්වයක් ද එහි දක්නට තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ ලංසු සුරක්ෂණය හා කොන්ත්‍රාත්කරුගේ අවදානම් රක්ෂණ (Bid bond, Contractar's Risk Insurance Performance Bond) පත්‍රවල කාලය 2012 මැයි 30 ඉකුත්වී තිබුණද ඒවා යාවත්කාලීන කර ගැනීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 මාර්තු 20 දිනෙන් පසු ගිවිසුම් ගත කාලය දීර්ඝ කර නොතිබීම හේතුවෙන් රු.126,341 ක ප්‍රමාද ගාස්තු අයකර ගතයුතුව තිබුණි.

(ඊ) ඉදිකිරීම සම්බන්ධ භෞතික ප්‍රගති වාර්තා නගර සභාව හා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2012 නොවැම්බර් 22 දිනැතිව අත්සන් කල අවබෝධතා ගිවිසුම පරිදි ඉදිරිපත් කර නොතිබුණි.

## 2.7 ආර්ථික නොවන ගනුදෙනු

නිල්වලා ගඟ අසබඩ කසළ බැහැරලන ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සභාව වෙත මධ්‍යම පරිසර අධිකාරියෙන් රු.12,989,500 ක මුදලක් ලබාදී එකී මුදල සභාව මගින් වැයකර තබූ අතර 2012 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අත්හැර දැමීමට සිදුව තිබුණෙන් දරන ලද වියදම ඵලරහිත වී තිබුණි.

## 2.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාවට අයත් කොටවිල පිහිටි කන්දකැටිය වත්ත ඉඩමෙහි පොලිතින්/අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ 2012 ඔක්තෝබර් 15 දින රු.4,828,236 ක් වටිනා ගිවිසුමකට එළඹ කළවැඩ සඳහා 2013 ජුනි 13 දින රු.1,296,903 ක මුදලක් ගෙවා තිබුණි.

(අ) ගිවිසුම්ගත පරිදි කර්මාන්තයේ වැඩ 2013 ජුනි 30 දිනට නිමවිය යුතු වුවද එදින වන විට වැඩ නිමකර නොතිබූ අතර එදිනට ගොඩනැගිල්ලේ බිත්ති බැද වහල සඳහා යකඩ කාප්ප සවිකරමින් තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය ඉලක්ක ගත කාල පරිච්ඡේදය තුල නිම නොවීම නිසා සභාව මගින් නඩත්තු කරනු ලබන කොටවිල කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ එක්රැස්වන පොලිතින්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය නොකොට බැහැර කිරීමට සිදුවී ඇති බව 2013 ජුනි 28 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, මියගිය හා සේවය හැර ගය නිලධාරීන් හා සේවකයින් 110 දෙනෙකුගෙන් රු.339,253 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව කාර්යාල හතක භාණ්ඩ විෂයයන් 315 ක ඌණතාවයට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන පාඩුව අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2005 මාර්තු 31 දින අංක 08 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව දේපල ණය සඳහා රු.1,391,712 ක මුදලක් රජයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි නගරාධිපතිවරයා, නියෝජ්‍ය නගරාධිපතිවරයා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන් 13 දෙනෙකු සහ නිලධාරීන් 04 දෙනෙකු 2012 වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදී නොතිබුණි.

(ඉ) සභාව 2002 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව හිඟහිට තිබූ රු.6,945,647 ක විගණන ගාස්තු විගණකාධිපතිවරයා වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ආයුර්වේද බෙහෙත් ශාලා කාර්ය මණ්ඩලයට සමාලෝචිත වර්ෂයේදී රු.1,149,674 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණ ද ආයුර්වේද ආධාර ලබා ගැනීම සඳහා ආයුර්වේද කොමසාරිස් වෙත යොමු කර නොතිබුණි.

2.10 මානව සම්පත් කළමනාකරණය
--------------------------------------

(අ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා තිබුණද එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 120 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සහ අරමුදලින් රු.10,744,092 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) මහා නගර සභාවේ පාලන වාර්තාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව 143 ක් විය. මෙම පුරප්පාඩු තුල නාගරික ලේකම්, නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, නගර නිර්මාන ශිල්පී, නීති නිලධාරී, පුස්තකාලයාධිපති, කාර්මික නිලධාරී යාන්ත්‍රික, මහජන සෞඛ්‍ය පරීක්ෂක, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී ආදායම් පරීක්ෂක තනතුරු පුරප්පාඩු වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මූලික ගිණි බට තනතුරු 01, පළමු පෙළ ගිණි බට තනතුරු 03 ක් යාන්ත්‍රික ගිණි බට තනතුරු 15 ක් හා ගින බට තනතුරු 15 ක් පුරප්පාඩුවී තිබුණෙන් හදිසි ගින්නක් ඇති වන අවස්ථාවන්හිදී එය මර්ධනය කිරීමේ හැකියාව පිලිබඳ ගැටළු ඇතිවී තිබුණි.

2.11 අභ්‍යන්තර විගණනය
----------------------

අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර කියාත්මක වී නොතිබුණි.

2.12 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය